මව්බිම

- ප්‍රකාශන
  සිලෝන් නිවුස් පේපර්ස් (පෞද්.) සමාගම, 101, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.
- දුරකතන (පොදු)
  011-7566566
- කර්තෘ මණ්ඩලය
  011-7566502/ 011-7566503
- ෆැක්ස් - 011-7566514
- වෙබ් අඩවිය - www.mawbima.lk
- ඊ-මේල්
  mbnews@ceylonnewspapers.lk
- බෙදාහැරීම්
  011-7566583/ 011-7566584
- ෆැක්ස් - 011-7566587
- දැන්වීම්
  011-7566568/ 011-7566572
- ෆැක්ස් - 011-7566569

මීතොටමුල්ල 'කුණු' ප්‍රශ්නය

කඳුකර ප්‍රදේශවල නායයෑම් සිදුවීමේ අරුමයක් නැත. එහෙත් කොළඹ නගරයේ කන්දක් නායගිය බව අසන්නට ලැබුණොත් එය පුදුමයට හේතුවකි. ගඟක් නැති වුවද 'පාලමක්' හැදීමට හපනුන් වන මෙරට දේශපාලනඥයන්ට කොළඹ නගරයේ 'කන්දක්' හැදීම එතරම් කජ්ජක් නොවේ. ඇත්තටම ඔවුහු කොළඹ කන්දක් නිර්මාණය කළහ. ඒ පස්වලින් නොව කුණුවලිනි. එනම්, කුණු කන්දකි.

කොළඹ මීතොටමුල්ලේ පිහිටි මේ කුණු කන්ද කලෙක සිට අවට ප්‍රදේශවාසීන්ට හිසරදයක් වී ඇත. වරෙක මේ කන්ද කඩා වැටුණේ මීතොටමුල්ලේ මිනිසුන්ගේ හිස් මතටය. නායයෑමෙන් දුක්වින්දේ ද, විසබීජවලින් රෝගී වන්නේද ඔවුහුම වෙති.

රාජපක්ෂ ආණ්ඩු සමයේ වරෙක මීතොටමුල්ලේ මිනිසුන් විශාල උද්ඝෝෂණයක නිරත වූයේ මේ කුණු ප්‍රශ්නය විසඳන මෙන් ඉල්ලමිනි. පොලිසියේ පමණක් නොව මැරයන්ගේ පාඩන පීඩනවලට ලක්වෙමින් ඔවුන් අඛණ්ඩව ගෙන ගිය උද්ඝෝෂණය අවසන් වූයේ 'ප්‍රශ්නයට' කඩිනම් විසඳුම් ලබාදෙන බවට බලධාරීන්ගේ පොරොන්දුව නිසාය. එහෙත් ඒ පොරොන්දුවද සෙසු පෙර පරිදිම කඩවුණු පොරොන්දුවක් බවට පත්වී ඇති බව මීතොටමුල්ලේ ජනතාව යළි පාරට බැසීමෙන් සනාථ වෙයි.

මීතොටමුල්ල කුණු කන්දට එරෙහි ජනතා ව්‍යාපාරය සංවිධානය කර තිබූ මෙවර විරෝධතාවට සහභාගි වූවෝ මාර්ගයේ ටයර් දැල්වූහ. විරෝධතාව නිසා පැය දෙකකට අධික කාලයක් මාර්ගය අවහිර වීමෙන් පසු ජල ප්‍රහාර එල්ල කර පිරිස විසුරුවා හැරීමට පොලිසිය පියවර ගත් අවස්ථාවේ විරෝධතාවේ කැඳවුම්කරුගේ ඇසක් තුවාල වී රෝහල් ගත කිරීමටද සිදුවී තිබිණි.

කෙසේ වුවද මාර්ගයෙන් ඉවත් වී මඟ දෙපස රැඳී සිටි විරෝධතාකරුවන් ඉවත්ව ගියේ පොලිසිය පොරොන්දුවක් ලබාදීමෙන් පසුවය. ලබන සිකුරාදා (29දා) අගමැතිවරයා සමඟ මේ ප්‍රශ්නය සම්බන්ධව සාකච්ඡා පැවැත්වීමට නියමිතව ඇති බව ඒ පොරොන්දුවයි. විරෝධතාකරුවන් ඉවත්ව ගියද ඔවුන් කියා සිටියේ ස්ථිර විසඳුමක් ලැබෙන තුරු කුණු දැමීමට මින් ඉදිරියට ඉඩ නොදෙන බවයි. එහෙත් 'පොරොන්දු' මත විරෝධතාකරුවන් සෑම වාරයකම පසුබැස ගිය අතර ලබාදුන් 'පොරොන්දු' වතුරේ ගියේය. අවුරුදු ගණනක් දුන් පොරොන්දු කඩු ගැසෙද්දී සිදුවූයේ කුණු කන්ද ඉහළයෑම පමණි.

චන්ද්‍රිකා ආණ්ඩුව, රාජපක්ෂ ආණ්ඩුව දුන් පොරොන්දු කඩ කළද මෛත්‍රී - රනිල් ආණ්ඩුවට එලෙස කළ නොහැක්කේ කොළඹට වැඩිම ඡන්ද කුට්ටිය 'අලියාට' හැමදාම ලැබෙන නිසාය. ඡන්ද ගොඩ පැත්තකින් තැබුවත් කුණු කන්ද නිසා දුක්විඳින මිනිසුන්ට සහනයක් සැලැසිය යුත්තේ ඔවුන්ට තවදුරටත් කුණු ගොඩේ පණුවන් මෙන් ජීවත් විය නොහැකි නිසාය. මිනිස්සු මහපාරට බසින්නේ 'කුණු' දැවෙන ප්‍රශ්නයක් වීම හේතුවෙනි. බලධාරීන්ට වගේ වගක් නැති වුවද කුණු කන්ද පාමුල ජීවත්වන මිනිසුන්ට එසේ බකංනිලාගෙන සිටිය නොහැකිය.

නෙලුම් කුලුන අහස ඉරාගෙන ඉහළට නැඟුණද අහස උසට කුණු කන්දක් ගොඩගැසෙන්නේ නම් කොළඹට ආඩම්බර විය නොහැකිය. නෙලුම් කුලුන උඩට නැඟ පහළ බලද්දී මහා කුණු කන්දක් ඇස ගැටේ නම් ලැබිය හැකි සතුට කුමක්ද? මීතොටමුල්ලේ මිනිසුන්ට පමණක් නොව රටේම මිනිසුන්ට මේ කුණු කන්ද 'ප්‍රශ්නයක්' විය යුත්තේ ඒ නිසාය.

විද්‍යාගේ ඝාතනයෙන් සමහරු දේශපාලන හා ජාතිවාදී අරමුණු මුදුන්පත් කරගන්න හදනවා

සමහර දේශපාලකයන්ට ඕනෑ ගැටුමක අවශ්‍යතා පෙළගස්වන්න

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ආචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රන්ජන්

උතුරේ පසුගිය කාලයේ සිදුවුණු ඝාතනයන් දිහා ආපසු හැරී බැලීමේදී ජාතිවාදී ස්වරූපයකට සමාජය ගොඩනැගෙන ආකාරය දකින්න පුළුවන්. ශ්‍රී ලංකාවේ ජාතිවාදී ගැටලු පිළිබඳ ඉතිහාසය සොයාගෙන සොයාගෙන යද්දී අපිට පැහැදිලිව පෙනෙන කාරණාවක් තමයි දොරේඅප්පා ඝාතනයේ ඉඳන් උතුරේ සියලු ඝාතනවලට යම් දේශපාලනික හෝ ජාතිවාදී අර්ථකථනයක් දෙන්න සමාජය උත්සාහ දරා තිබීම.

පසුගිය දවස්වල යාපනයේදී සමූහ දූෂණයකට ලක්වෙලා ඝාතනය වුණු සිවලෝගනාදන් විද්‍යා දැරියගේ සිදුවීමත් වර්තමානයේ දේශපාලන අරමුණු සහ ජාතිවාදී අරමුණු මුල්කරගනිමින් විවිධ මතවාද ගොඩනැඟීමේ උත්සාහයක් පවතින බව පැහැදිලි කරුණක්.

ලංකාවේ ජාතිවාදී අරගලවලදී ප්‍රධානම කාරණාවන් කිහිපයක් බලපාලා තියෙන ආකාරය දකින්න පුළුවන්. ජාතීන් අතර ආර්ථිකමය වශයෙන් ගොඩනැගෙන අසමබරතාව ඉන් ප්‍රධාන කාරණාවක්. ඒ වගේම දේශපාලන වශයෙන් ගොඩනැගෙන අසධාරණතාව තවත් කාරණාවක්. ජාතීන් වශයෙන් එකිනෙකාට ගරු නොකිරීම සහ ඊට අදාළ පදනම් බිඳ වැටීම තවත් කාරණාවක්. වර්ග හෝ ජාති මුල්කරගෙන ජන විඥානය ගොඩනැංවීම තවත් ප්‍රධාන කාරණාවක්. ඒ වාගේම ජාතීන් වශයෙන් පොදු ඒකාග්‍රතාවකට පැමිණීමට නොහැකිවීම තවත් කාරණාවක්. මේ ආකාරයට ආර්ථිකමය වශයෙන් සහ සමාජ, දේශපාලනමය වශයෙන් ගොඩනැගෙන්නා වූ අර්බුදය සමස්ත සමාජයටම කිඳා බසින ආකාරය අපිට පැහැදිලි වෙනවා. වර්තමානයේදී ගෝලීය සමාජය දෙස අවධානය යොමුකරන විට ගැටලුවලින් මිදීමේ හැකියාව ශ්‍රී ලාංකේය සමාජයට තියෙනවා කියලා විශ්වාස කරන්න පුළුවන්කමක් නැහැ.

සිංහල, දෙමළ ගැටලුව ගැන ඉතිහාසයේ සිටම විමර්ශනය කරද්දී පැහැදිලිවන කරුණක් තමයි කිසිවෙක් ජනතාවගේ අවශ්‍යතා ඉටුකරන්න ඉදිරිපත් නොවූ නිසා මේ ගැටලු සියල්ලම ඇතිවී තිබෙන බව. යළිත් එවැනි ගැටුමකට යෑමේ කිසිම අවශ්‍යතාවක් නැහැ. නමුත් ඒ ගැටුමේ අවශ්‍යතාව පෙළගස්වන්න උත්සාහ දරන්නේ දේශපාලකයන්ගේ අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට බව නම් පැහැදිලියි.

නමුත් ද්‍රවිඩ ජනතාව සහ සිංහලයන් අතර ගොඩනගන්නා වූ මේ අර්බුදය ලංකාවේ සිදුවන සමාජයීය සිද්ධි අධ්‍යයනය කරලාම තේරුම් ගැනීමේ හැකියාවක් නැහැ. එයට හේතුව ජාතිවාදී අරගල ගෝලීය හා යුරෝපීය සමාජයන් තුළ ගැබ්වී ඇති ආකාරය පැහැදිලියි. එය අපිට උදාහරණයක් විදියට දක්වන්න පුළුවන් වර්තමානයේ ලිබියාවට සිදුවී ඇති ක්‍රියාවලිය. ඒ වාගේම ඉරාකයට, ඉරානයට සිදුවන දෙය සහ ඊළමේ තිබෙන අර්බුදයන් දෙස අවධානය යොමු කරන කොට ඒවායේ ජාතිවාදී පදනම සහ යුරෝපයෙහි ගොඩනැගෙන්නා වූ සමාජයීය අර්බුද ශ්‍රී ලාංකේය සමාජය පදනම් කරගෙන කියවිය යුතුයි.

සමාජය ගැන හරි අවබෝධයක් ලබාගන්නනම් අපි මේ ලිබියාව, යේමනය, ඉරාකය, ඉරානය වගේ රටවල සිදුවන දේවල් ගැන විශාල වශයෙන් අධ්‍යයනයක් කළ යුතුයි. ඒ රටවල සිදුවන ක්‍රියාවලිය පිළිබඳ සියලු දේ තුළින් ලංකාවේ සිදුවන ජාතිවාදී අරගල පිළිබඳව කියැවීමට නොහැකිවන්නේ ජාතිවාදී අරගලයට යුරෝපීය හස්තය ක්‍රියාත්මක වීම නිසයි. ඒ අනුව පසුගිය කාල සීමාවේ සිදු වූ දමිළ ස්ත්‍රී දූෂණයේ සහ එම ඝාතනයේ ප්‍රයෝජනය යුරෝපීය සමාජය සහ ලංකාවේ යම් යම් දේශපාලන මතවාදයන් වාසියට හරවාගෙන කියලා. මේ ක්‍රියාවලිය තුළින් පැහැදිලිව දැකිය හැකි වෙනවා. විශේෂයෙන්ම වර්තමානය වන විට යුරෝපයට දැඩි අවශ්‍යතාවක් තියෙනවා ලාංකේය සමාජය තුළ දැඩි අස්ථාවරභාවයක් නිර්මාණය කරන්න. එම ලාංකේය සමාජයේ අස්ථාවරකරණය ඔස්සේ යුරෝපීය සමාජය එය වාසියට හරවාගන්න යම් යම් අවශ්‍යතාවන් ගොඩනගාගන්න පුළුවන්. විශේෂයෙන්ම ලංකාවේ තියෙන භූගෝලීය පිහිටීම යුරෝපයට බලපාන වැදගත් කාරණයක්. ඒ කාරණාව පසුගිය කාල සීමාව තුළ සිදුවුණු යම් යම් සංසිද්ධීන් තුළින් අපට පැහැදිලිව දකින්නට ලැබුණා. වර්තමානය වන විට විවිධ ව්‍යවස්ථා ආදී සංශෝධනයන් තුළින් විධායකයේ ශක්තිය අඩු කරලා තියෙනවා. අඩු වෙමින් පවතිනවා. ඒ අඩුවෙමින් පැවැතීමත් එක්ක එතැනින් නවතින්න පුළුවන්කමක් නෑ. මොකද අඩුවෙනවනම් විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ශක්තිමත් වෙන්න ඕනි. නමුත් වර්තමානයේ විධායකයේ බලතල අඩුවීමක් සමඟින් ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව එවැනි ආකාරයකින් ශක්තිමත් වන ආකාරයක් අපිට දකින්න පුළුවන්කමක් නෑ. උතුරේදී තවදුරටත් පාර්ලිමේන්තුව තුළ ගැටලු නිර්මාණය වෙමින් එහි සංයුතිය වෙනස් වෙමින් තව තවත් අස්ථාවර තත්ත්වයට පත්වෙමින් තීරණ ගැනීමේදී අස්ථාවර තැනකට ගමන් කරමින් තිබෙන ආකාරයක් තමයි අපිට දකින්න තියෙන්නෙ.

දේශපාලනය තුළ ගොඩනැගෙන්නා වූ මෙම අර්බුදය දේශපාලනයටම සීමා වෙන්නේ නෑ. එය සමාජ අර්බුදයක් දක්වා විකාශනය වන ආකාරයක් දකින්න පුළුවන්කමක් තියෙනවා. එය විවිධ චර්යාවන් තුළින් පැහැදිලිව දකින්න පුළුවන්. උතුරේ සිදුවුණු දමිළ සිසුවියගේ ඒ ඝාතනයත් සමඟින් නීතියට ගරු නොකිරීමත්, විශේෂයෙන්ම උත්තරීතර ආයතනයක් වශයෙන් පැවැතිය යුතු අධිකරණයට පවා ගල් ගසා දැඩි ලෙස නීති පිළිනොගැනීමේ කාරණාවත්, නීතිය උපහාසයට ලක් කිරීමේ කාරණාවත් නීතිය හෑල්ලුවීමේ කාරණාවත් අපිට දකින්නට පුළුවන්. සැබෑ ලෙසම එවැනි දෙයක් සිදු වුණා. එය සරල ක්‍රියාවලියක් ලෙස සලකන්න පුළුවන්කමක් නැහැ. එයට හේතුව තමයි උත්තරීතරමය වශයෙන් පැවැතිය යුතු ස්ථානවලට කඩාකප්පල්කාරීන් ගල් ගැසීම වැනි ක්‍රියාකාරකම් තුළින් හෑල්ලුවට ලක්කිරීම මඟින් සමාජය තුළ ඒ ආයතන පිළිබඳව තිබෙන පිළිගැනීම සම්බන්ධයෙන්ද දැඩි අර්බුදයක් මතු වෙන නිසයි.

මීට කලිනුත් ඔය වගේ අධිකරණයට අපහාස කරපු අවස්ථා තිබුණා. නමුත් පසුගිය කාල සීමාව තුළ සිදුවුණු අධිකරණය හෑල්ලුවට ලක්කිරීමේ සංසිද්ධීන් දේශපාලනඥයන්ගේ මැදිහත්වීම තුළින්ම සිදුවීම තමයි ප්‍රබලම ගැටලුව වෙන්නෙ. ඒ කියන්නේ දේශපාලනඥයා සහ දේශපාලන ක්‍රමවේදයන් විසින්ම අධිකරණය හෑල්ලුවට ලක්වීමට අවශ්‍ය කාරණාවන් සමාජය තුළ ඇති කිරීමයි මෙහි ඇති ගැටලුව. මේත් එක්කම බිඳ වැටෙන්නේ දේශපාලන ක්‍රියාවලියකට වඩා සමාජයීය පදනම කිව්වොත් නිවැරැදියි. විශේෂයෙන්ම මේ නිසා මෙවැනි දේවල් සිදුවීම වළක්වා ගන්න අප කටයුතු කළ යුතුයි. ඉතිහාසයේ සිටම මේ රටේ තිබුණු දේශපාලනමය වාතාවරණයන් පිළිබඳව පුරවැසියන් හැටියට අපට සතුටුවීමට හැකියාවක් නැහැ. මෑතකදීම සිදුවුණු මේ සිද්ධියට දේශපාලනමය වශයෙන් වූ සම්බන්ධය ගැනත් අපට සතුටු වෙන්න බෑ. දේශපාලනඥයාගේ චර්යාව පිළිබඳ ගැටලුව, දේශපාලනඥයාට ඉදිරි දැක්මක් නොමැතිවීම වගේ කාරණාවලින් සංයුක්ත වූ පිරිසක් තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්නෙ. මේ ගැටලු සමාජ ගැටුම් දක්වා පරිවර්තනය වෙමින් ඉදිරියට ගමන් කරන ආකාරය පසුගිය කාලෙ සිදුවුණු සිදුවීම් අනුව පැහැදිලි වෙනවා.

මේ වගේ තත්ත්වයන් දිගු කාලීනව තමන්ගේ දේශපාලන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා යොදා ගැනීම රටේ සංවර්ධනයට වගේම සමාජයේ ප්‍රගමන ක්‍රියාවලියටත් මහා විශාල බාධාවක්.

මේ වර්ගවාදී ගැටලු ගැන ඉතිහාසයේ සිටම අධ්‍යයනය කරගෙන යනකොට විශේෂයෙන්ම වර්ගවාදී ගැටලුවට ඉතිහාසයේ විසඳූ ආකාරයට විසඳාගන්න වර්තමානය වන විට අපිට නොහැකි වෙලා තියෙනවා. ඒකට හේතුව මේ ගැටලු එක්ක යුරෝපය ප්‍රබල ලෙස මැදිහත්වී තිබීමයි. විශේෂයෙන්ම මෙම ජාතිවාදී, සමාජවාදී ගැටලුවලින් ඉවත් වීමට නම් ශ්‍රී ලංකාව දේශපාලනිකව ශක්තිමත් විය යුතුයි. අනෙක් කාරණය පුරවැසියා තුළ ජීවත්වීමට අදාළ සමාජ තර්කයට පුරවැසියා අනුගත වීම අත්‍යවශ්‍යයි.

දේශපාලනමය වශයෙන් මේ කාරණා බැලීමේදී වර්ගවාදී ගැටලුවක් නිර්මාණය වීම අවශ්‍යයි කියන තැනයි අද දේශපාලනඥයා ඉන්නෙ. හැබැයි එය සමහර දේශපාලනඥයන්ගේ යටි අරමුණු පමණයි. හැබැයි මෙතැනින් මිදී දේශපාලනඥයා පුරවැසියකු වශයෙන් ශක්තිමත් වෙනව නම් මෙවැනි සමාජ විරෝධී වර්ගවාදී ගැටලු උද්ගත නොවීමට ඉඩ තියෙනවා. ඒ වාගේම එකිනෙක පුරවැසියා තමන්ට මෙන්ම සමාජයට වගකියන කෙනෙක් බවට පත්විය යුතුයි. එමෙන්ම සමාජ ආර්ථික ක්‍රියාවලිය පිළිබඳව පුරවැසියාට ගෝලීය වශයෙන් දැනුමක් ලබාදීමත් වැදගත් වෙනවා.

ජාතිවාදී අරගලය ගොඩනැඟීමට බලපාන හේතු කාරණය ඉරාකය, ඉරානය, යේමනය තුළින් තේරුම් ගන්න පුළුවන් වෙනවානම් මේ දේවල් බොහෝ දුරට අවම කරගැනීමට හැකි වෙනවා. මේ සඳහා පුරවැසියා ශක්තිමත් කිරීමේ වගකීම පැවරෙන්නෙ වර්තමානයේදී විශේෂයෙන්ම දේශපාලනඥයාටයි. ඊට අමතරව සමස්ත සමාජයීය ක්‍රියාවලියම දේශපාලන ක්‍රමවේදයකට ග්‍රහණය වෙලා තියෙනවා. එයින් වැළකිලා සමාජ ආර්ථික තර්කණයන් සහ චින්තනයන් තුළින් සමාජ ගැටලු දෙස බලනවානම් මේ දේවල් සඳහා පුරවැසියා ශක්තිමත් වීම වළක්වන්න බෑ. එය පසුගිය සමයේ සිදුවුණු ආකාරයේ සමාජ විරෝධී ක්‍රියාවන් නතර කිරීමට උදව්වන ප්‍රධාන හේතුවක් වෙනවා.


ආසියාවේ ලොකුම පොහොසතා කියලා මට අභූත චෝදනා එල්ල කරනවා....!